සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# නාට්‍ය හා රංග කලාව

9 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- **A** සිට **E** දක්වා නාට්‍ය ගීත උපයෝගී කර ගනිමින් ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A ඇහැළ මලින් ගස් පිරිලා - බලන්න හරි ලස්සනයි
අඹ රඹුටන් ජම්බු ඉදිලා - අද හැම තැන හරි හැඩයි

B ප්‍රේමයෙන් මන රංජිත වේ - නන්දිත වේ
පුෂ්පයෙන් වන සුන්දර වේ - ලංකෘත වේ

C සෝබාව දේ මෙපුර සිරි විසිතුරු
බලනු මිතුරු මඟ පියකරු වූ

D සිරි සඟ බෝධි මාළිගාවේදි
දැක ප්‍රාණෙ හානි වෙන්ට බැට දෙම්

E සෙලවෙනකොට වැල් පාලම
දෑස පියන් බිම නොබලන්

01 එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් නිර්මාණය කරන ලද නාට්‍යයකට අයත් ගීත කොටස ඇතුළත් අක්ෂරය වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

02 ''හුණුවටයේ කතාව'' නාට්‍යයේ එන ගීත කොටස අයත් වන අක්ෂරය වන්නේ,

(i) A (ii) C (iii) D (iv) E

03 A අක්ෂරයෙන් දැක්වෙන ගීත කොටස ඇතුලත් නාට්‍ය වන්නේ,

(i) හුණුවටයේ කතාව (ii) නරි බෑණා
(iii) මනමේ (iv) සිංහබාහු

04 D අක්ෂරයෙන් දැක්වෙන ගීත කොටස

(i) නූර්ති ගීතයක කොටසකි. (ii) ළමා ගීතයක කොටසකි.
(iii) චිත්‍රපට ගීතයක කොටසකි. (iv) ප්‍රශස්ති ගීතයක කොටසකි.

05 ''තාරාවෝ ඉගිලෙති'' නාට්‍යයට අයත් ගීත කොටස වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන වචන වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(භූමිකා / සමාරෝපය / සජීවී / වේෂ භූෂණ / සේරිවාණිජ ජාතකය / අනුකරණය)

06 රංග වස්ත්‍රාභරණ ........................................................ යනුවෙන් ද හඳුන්වයි.

07 කදාවළලු නාට්‍ය ........................................................ ආශ්‍රයෙන් නිර්මාණය වී ඇත.

08 වේදිකා නාට්‍යයක පවතින සුවිශේෂී ලක්ෂණය වනුයේ ............................................... බවයි.

09 නළුවන් වෙනත් චරිතයකට ප්‍රවේශ වීම ............................................ ලෙස හඳුන්වයි.

10 චරිතයක පවතින විවිධ පැතිකඩ ........................................................ නම් වේ.

- **පහත වගුව ඇසුරින් 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| A | B | C | D |
|---|---|---|---|
| චිත්‍ර | අංග රචනය | චරිත | අධ්‍යාපන |
| නර්තනය | රංග භාණ්ඩ | සංවාද | ආර්ථික |
| සංගීතය | පසුතල නිර්මාණ | රංග විධාන | දේශපාලන |

11 ඉහත වගුවේ B තීරුවේ දක්වා ඇත්තේ,

(i) ප්‍රාසංගික කලාවන් ය. (ii) ආනුෂංගික කලාවන් ය.

(iii) නර්තන කලාවන් ය. (iv) සන්නිවේදන කලාවන් ය.

12 කෙනෙකුගේ චරිත ලක්ෂණ තීරණය වීමට බලපානු ලබන අංග ඇතුලත් තීරුව වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

13 නාට්‍ය පිටපතක අන්තර්ගත අංග ඇතුලත් තීරුව වන්නේ,

(i) A (ii) B (iii) C (iv) D

14 ඉහත වගුවේ A තීරුව තුළ දක්වා ඇත්තේ,

(i) ප්‍රාසංගික කලාවන් ය. (ii) නාට්‍ය කලාව තුළ අන්තර්ගත කලාවන් ය.

(iii) ආනුෂංගික කලාවන් ය. (iv) රංගන කලාවන් ය.

15 B තීරුවෙහි ඇතුලත් කොටස් අයත්වන අභිනය වන්නේ,

(i) ආංගික අභිනයයි. (ii) වාචික අභිනයයි.

(iii) සාත්වික අභිනයයි. (iv) ආහාර්ය අභිනයයි.

- **අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

16 නාට්‍යයක පෙළ කියවීමෙන් ලැබෙනුයේ සාහිත්‍යමය රසයකි. ( )

17 නාට්‍යයක ශෛලිය අනුව ආනුෂංගික කලාවන් වෙනස් නොවේ. ( )

18 ප්‍රධාන නාට්‍ය ශෛලීන් 3 කි. ( )

19 'ගැටුම' නාට්‍යයක තිබිය යුතු විශේෂ ලක්ෂණයකි. ( )

20 භාව නිරූපණයේ දී නළුවාගේ ඇස් වැදගත් නොවේ. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න <u>තුනකට</u> පිළිතුරු සපයන්න.**

01 පහත සංවාද කොටස ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිත්තණිය - (නරඹන්නන් දෙස බලා) මේ මිනිහ, අර මිනිහටත් වඩා අමාරුකාරයෙක් පාටයි.

සිටු දුව - මේ වළලුත් ගෙනාවෙ කසී රටෙන් ද?

කච්ඡපුට - (සිනාසී) කසී රටෙන් ? ඒ තරම් දුර යන්නෙ කවුද වළලු ගේන්න. ඇරත්, කසී රටේ වළලු කියා අමුතු ජාතියක් තියෙනව ද? කෝකත් එකයි.

සිටු දුව - (මිත්තණියට) මේවා අර මිනිහ ගෙනාපු වළලු වගේමයි. (වෙළෙන්දාට) මේවා සාමාන්‍ය වළලු වලට වඩා වෙනස් නේද?

(i) ඉහත සංවාද උපුටාගත් නාට්‍ය නම් කරන්න. (ල. 02)

(ii) මෙම නාට්‍යයේ නිර්මාණකරු කවරෙක් ද? (ල. 02)

(iii) මෙම සංවාද කොටසෙහි ඇතුලත් රංග විධාන 2 ක් ලියන්න. (ල. 02)

(iv) මෙම නාට්‍යයෙහි ප්‍රධාන චරිත හතර නම් කරන්න. (ල. 02)

(v) මෙම නාට්‍යය ඉදිරිපත් කර ඇති ශෛලිය නම් කරන්න. (ල. 02)

02 (i) සමාරෝපය යනු කුමක් ද? (ල. 02)

(ii) සමාරෝපයේ ප්‍රධාන කොටස් කීයද? ඒවා නම් කරන්න. (ල. 03)

(iii) නාට්‍යයක් සාර්ථකවීමට සමාරෝපය බලපාන ආකාරය විස්තර කරන්න. (ල. 05)

03 (i) භූමිකාවක් යනු කුමක් ද? (ල. 02)

(ii) භූමිකා රංගනයේ දී අවධානය යොමු කළ යුතු අංශ 2 නම් කරන්න. (ල. 02)

(iii) ''ජිනපාල වෘත්තියෙන් වෛද්‍යවරයෙකි. ඔහු දියණියක් හා පුතෙක් සිටින දෙදරු පියෙකි. බිරිඳ හා දරුවන් සමග නිවසේ යහපත් දිවියක් ගත කරන ඔහු විහාරස්ථානයේ ප්‍රධාන දායක බැතිමතා ය. ග්‍රාම සංවර්ධන සමිතියේ භාණ්ඩාගාරික ලෙස ද ඔහු විශාල මෙහෙයක් ඉටු කරයි.''

මෙම විස්තරයට අදාළව භූමිකා ප්‍රස්ථාරයක් ඇඳ දක්වන්න. (ල. 06)

04 (i) 'අනුශාංගික කලා' යන්න කෙටියෙන් අර්ථ දක්වන්න. (ල. 02)

(ii) අනුශාංගික කලාවන් 4 ක් නම් කරන්න. (ල. 02)

(iii) අනුශාංගික අංග භාවිතයෙන් වේදිකා නාට්‍යයකට සිදුවන මෙහෙය පැහැදිලි කරන්න. (ල. 06)

05 (i) නාට්‍යයක් ඉදිරිපත් කළ හැකි ප්‍රධාන ශෛලීන් 2 නම් කරන්න. (ල. 02)

(ii) එක් එක් ශෛලියට අනුව නිර්මාණය වූ නාට්‍ය දෙක බැගින් නම් කර, එම නාට්‍යවල නිර්මාණකරුවන් නම් කරන්න. (ල. 02)

(iii) ප්‍රධාන නාට්‍ය ශෛලීන් හි වෙනස්කම් සංසන්දනාත්මකව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | ii | (02) | iv | (03) | ii | (04) | i | (05) | iii | (06) | වේෂ භූෂණ | (07) | සේරිවාණිජ ජාතකය |
| (08) | සජීවී | (09) | සමාරෝපය | (10) | භූමිකා | (11) | ii | (12) | iv | (13) | iii | | |
| (14) | ii | (15) | iv | (16) | ✓ | (17) | × | (18) | × | (19) | ✓ | (20) | × |

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

01 (i) කදාවළලු

(ii) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා

(iii) (නරඹන්නන් දෙස බලා), (සිනාසී), (මිත්තණියට), (වෙළන්දාට)

(iv) සේරිවාණිජ, කච්ඡපුට, සිටු දුව, මිත්තණිය

(v) නාට්‍යධර්මී

02 (i) නළුවෙකු වෙනත් චරිතයකට ප්‍රවේශ වීම සමාරෝපයයි.

(ii) 2 කි. අභ්‍යන්තර සමාරෝපය / බාහිර සමාරෝපය

(iii) පිළිතුර අනුව ලකුණු ලබාදෙන්න.

03 (i) චරිතයක් තුළ ඇති විවිධ පැතිකඩ 'භූමිකා' නම් වේ.

(ii) භූමිකාවේ අභ්‍යන්තර සහ බාහිර අංශ දෙකකි.

(iii) අදාළ භූමිකා ප්‍රස්ථාරය අනුව ලකුණු ලබාදෙන්න.

04 (i) වේදිකා නාට්‍යයක් තුළ ඇති (අන්තර්ගත) විවිධ කලාවන් අනුශාංගික කලාවන් ය.

(ii) අංග රචනය / ආලෝකකරණය / වේදිකා පසුතල නිර්මාණ / නාට්‍ය සංගීතය / වේෂ භූෂණ ආදී කලාවන්

(iii) අදාළ පිළිතුර අනුව ලකුණු ලබාදෙන්න.

05 (i) ලෝකධර්මී ශෛලිය, නාට්‍යධර්මී ශෛලිය

(ii) නිවැරදි පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න.

(iii) සංසන්දනාත්මකව කරුණු 3 ක් විස්තර කර ඇත්නම් ලකුණු ලබාදෙන්න.